# හේතුව හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගීන්ගේ පැවතුම් රටා විශ්ලේෂණය කිරීම: තඹුත්තේගම රෝහලේ ලියාපදිංචි රෝගීන් ඇසුරින්

ඩී.එම්.එම්.එන්. බණ්ඩාර - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

හේතුව හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය (CKDu) ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි බරපතළ අර්බුදකාරී තත්වයක් ඇති කර ඇත්තේ ය. කෘෂිකර්මාන්තයේ සක්‍රියව නියැළී සිටින ගොවි ජනතාව කේන්ද්‍ර කරගනිමින් ව්‍යාප්ත වී පවතින මෙම රෝගය හේතුවෙන් ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ජීවත් වන ජනගහනයෙන් හයෙන් එකක්ම රෝගී භාවයට පත් වී ඇත. නමුත් රෝගයේ රෝග මූලය පිළිබඳ තවමත් පවතින්නේ ගැටලුකාරී තත්වයකි. එවන් පසුබිමක් යටතේ මෙම රෝගීන්ගේ පැවතුම් රටා විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. ඒ අනුව තඹුත්තේගම මූලික රෝහලේ ලියාපදිංචි රෝගීන් 26 දෙනෙකු යොදා ගනිමින් පැවතුම් විශ්ලේෂණය සිදු විය. පැවතුම් විශ්ලේෂණය මගින් රෝගියෙකුගේ ජීවත් වීමේ සම්භාවිතාව 0.88 ලෙසත්, මියයාමේ සම්භාවිතාව 0.12 ලෙසත්, සායනවලින් බැහැර වීමේ සම්භාවිතාව 0.4 ලෙසත් හඳුනා ගන්නා ලදී. මියයාමේ සම්භාවිතාවට වඩා සායනවලින් බැහැර වීමේ සම්භාවිතාව ඉහළ වීම විශේෂත්වයකි. සායනවලින් බැහැර වීමට බලපා ඇති ප්‍රධානතම සාධකය වන්නේ හිතාමතා වෛද්‍ය ප්‍රතිකාරවලින් ඉවත් වී සිටීමයි. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී හඳුනාගත හැකි වූ ආකාරයට රෝගය පිළිබඳ රෝගීන් තුළ පවතින අනවබෝධය, සමාජයීය වශයෙන් ඇති වන අපකීර්තිය නිසා රෝගය වසන් කිරීම සහ මූල්‍යමය වශයෙන් පවතින දුෂ්කරතා හේතුවෙන් සායනවලින් ඉවත් වීම යන හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත. *Kaplan-Meir* පැවතුම් විශ්ලේෂණ ක්‍රමය අනුව රෝගයේ තුන හෝ හතර අවධිවල සිටින රෝගීන් අඩුම ජීවත් වීමේ සම්භාවිතාවක් පෙන්වා ඇත. ඒ අනුව සායනවලින් බැහැර වී සිටින තුන හෝ හතර රෝග අවධිවලට අයත් වන රෝගීන් ද මියගොස් ඇති බවට සාධාරණ උපකල්පනයකට එළඹිය හැකිය. දේශීය ආර්ථිකයේ ජීවනාලිය බඳු ගොවි ජනතාව රෝගයෙන් මුදවාගනු සඳහා රෝගයට ගොදුරු වූ පසු එයට විසඳුම් සෙවීම වෙනුවට රෝගයට ගොදුරු වීමට පෙර ආරක්ෂිතව තම වෘත්තීය කටයුතුවල නිරත වීමට රෝග අවදානම් සහිත ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලි ක්‍රියාත්මක කළ යුතුය. එසේම රෝගය කෙරෙහි ඇති නොදැනුවත්භාවය දුරු කරමින් ප්‍රතිකාර සඳහා නොකඩවා යොමු කරවා ගැනීමටත්, සමාජයීය වශයෙන් රෝගීන්ගේ මට්ටම උසස් කිරීම සඳහාත් ජාතික වශයෙන් විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතුය. තවද තවදුරටත් පැවතුම් විශ්ලේෂණ සිදු කරමින් පැවතුම් රටා නියැදියෙන් නියැදියට වෙනස් වන්නේද යන්න අධ්‍යයනය කිරීම සඳහාත් පර්යේෂණ සිදු කළ යුතුය.

***ප්‍රමුඛ පද:*** *හේතුව හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය, ගොවි ජනතාව, පැවතුම් විශ්ලේෂණය*